## ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

## කොළඹ

***

## <u>පුවත්පත් නිවේදනය</u>

### <u>ඉන්දීය ජාතිකයන් රැගත් පළමු විශේෂ ගුවන්යානය කොළඹ සිට ඉන්දියාව බලා පිටත් වේ</u>

ශ්‍රී ලංකාවේ සිරව සිටි ඉන්දීය ජාතිකයන් 176 දෙනෙකු රැගත් AI 0276 දරණ පළමු විශේෂ එයා ඉන්ඩියා ගුවන් යානය අද දින කොළඹ සිට මුම්බායි, භුබනේස්වර් සහ කල්කටා බලා පිටත් විය . කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ලොව පුරා විවිධ රටවල සිරව සිටින ඉන්දීය ජාතිකයන් නැවතත් මව්රටට ගෙන්වා ගැනීම සඳහා ඉන්දියාව විසින් මෙතෙක් ක්‍රියාත්මක කර ඇති විශාලතම වැඩසටහන වන 'වන්දේ භාරත්' වැඩසටහන යටතේ මෙම ගුවන්යානය සූදානම් කර තිබිණ.

2. ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා ඉන්දීය ජාතික මගීන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේදී හමු වූ අතර ඔවුන්ට සුරක්ෂිත ගුවන් ගමනක් ප්‍රාර්ථනා කළේය . ගුවන් මගීන් ඉන්දියාවට යාමෙන් පසු අනුගමනය කළයුතු සෞඛ්‍ය පිළිවෙත් පිළිබඳව කොළඹ , ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් විසින් දැනුවත් කරන ලදී. නැවතත් මව්රටට යාමට අවස්ථාව ලද මගීන් ගුවන්යානයට ගොඩවීමට පෙර දෙරටෙහිම රජයන් වෙත සිය කෘතවේදීත්වය පළ කළේය.

3. මහ කොමසාරිස්තුමා ශ්‍රී ලංකාවේ සිරව සිටින ඉන්දියානු ජාතිකයන් නැවතත් මව්රටට යැවීම සඳහා ලබා දුන් සහයෝගයට ශ්‍රී ලංකා රජයට සිය ස්තුතිය පළ කළේය. වන්දේ භාරත් වැඩසටහන සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය සහ පවුල් සුබසාධන අමාත්‍යාංශය, අභ්‍යන්තර කටයුතු

අමාත්‍යාංශය, ලොව පුරා ඇති ඉන්දීය තානාපති සහ කොන්සියුලර් කාර්යාල සහ ඉන්දියාවේ ප්‍රාන්ත ආණ්ඩු විසින් ක්‍රියාත්මක සාමූහික ප්‍රයත්නයක් බව එතුමා ප්‍රකාශ කළේය. ඉන්දියාවේ සිට දහසකට අධික ශ්‍රී ලාංකිකයන් පිරිසක් නැවතත් දිවයිනට ගෙන ඒමට ඉන්දීය රජය ලබා දුන් සහයෝගය සිහිපත් කරමින් මහ කොමසාරිස්තුමා සඳහන් කළේ කොවිඩ් 19 වසංගත තත්වය තුළ ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකිකයන් මව්රටට ගෙනඒම සඳහා හැකි සෑම සහයක්ම ලබා දීමට ඉන්දියාව තවදුරටත් කැපවී සිටින බවයි.

4. ඉන්දියානු ජාතිකයන් මව්රටට ගෙනඒම සඳහා දරන ප්‍රයත්නය ඉදිරියට ගෙන යමින් ඉන්දීය නාවික හමුදාවේ ජලෂ්වා නෞකාව 2020 ජූනි මස පළමු වන දින කොළඹ වරායේ සිට ඉන්දියවේ ටුටිකොරින් දක්වා පිටත් වනු ඇත. ඉන්දියානු ජාතිකයන් 700කට ආසන්න පිරිසක් මෙම නෞකාවෙන් ඉන්දියාව බලා පිටත් වනු ඇත. මේ සඳහා අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා රජයේ සම්බන්ධීකරණය ඇතිව සිදු කෙරෙමින් පවතී. මෙය වන්දේ භාරත් මෙහෙයුම යටතේ විදේශයන්හි සිරව සිටින ඉන්දියානු ජාතිකයන් මව් රටට ගෙන්වා ගැනීම සඳහා ඉන්දීය නාවික හමුදා නෞකා යොදාගෙන කරනු ලබන සමුද්‍ර සේතු වැඩසටහනේ මීළඟ ව්‍යායාමය වේ.

5. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි වීම් මත පදනම්ව මෙම ගුවන් යානා/නෞකා සඳහා මගී ලේඛනයක් සකස් කර ඇත. මේ සඳහා සේවයෙන් ඉවත් කරන ලද සංක්‍රමණික ශ්‍රමිකයන්/කම්කරුවන්, කෙටි කාලීන වීසා බලපත්‍ර කල් ඉකුත් වූ අයවලුන්, හදිසි වෛද්‍ය අවශ්‍යතා ඇති අයවලුන්, ගර්භණී මව්වරුන්/ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, පවුලේ සාමාජිකයකුගේ අවමංගල්‍යයක් සඳහා ඉන්දියාවට යාමට අවශ්‍ය කරන අයවලුන් සහ ඉන්දීය රජයේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද විදෙස් රටවල සිරව සිටින ඉන්දියානු ජාතිකයන් සිය රටට ගෙන්වා ගැනීමේ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියේ දැක්වෙන පරිදි ශිෂ්‍යයන් ඇතුළු අත්‍යාවශ්‍ය අයවලුන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත.

6. මේ වන තෙක් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි වී නැති ඉන්දීය ජාතිකයන්ට පහත ලින්ක් එක මගින් ලියාපදිංචි විය හැකිය.

https://hcicolombo.gov.in/COVID_helpline ශ්‍රී ලංකාවේ සිරව සිටින ඉන්දීය ජාතිකයන්ට ඉවසීම සහගතව සිටිනා ලෙස සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ නිල වෙබ් අඩවියේ සහ සමාජ මාධ්‍යයන්හි යාවත්කාලීන කිරීම් පිළිබඳව අවධානයෙන් සිටින ලෙස උපදෙස් දෙනු ලැබේ.

*****

කොළඹ

ශක වර්ෂ 1942 ජ්‍යෙෂ්ත 08

2020 මැයි 29